# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/46 - 2013 ජූලි මස 19 වැනි සිකුරාදා - 2013.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(xii).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ සහිතව (2009 ජුනි මස 18 වැනි දින අංක 1606/26 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එහි 21 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු වන්නා වූ ශ්‍රී ලංකාවේ, මොරටුව විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "වාස්තු විද්‍යා පීඨය" යන අයිතමයට සහ ඊට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"4. සමෝධානික නිර්මාණ අධ්‍යයන අංශය"

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013ක් වූ ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-221


1A - PG 1692— 810 (2013/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*